බෝ ගහ හන්දිය 25 වන කථාංගය පසු කරයි

බෝගහ හන්දියේ පැතිලා පිහිනන මිනිස්සු

"මේක හරිම සුන්දර වැඩක්. අපි හැමෝම එක කණ්ඩායමක් ලෙස එකමුතුව පුදුම සතුටකින් මේක කරන්නෙ. බෝ ගහ හන්දිය තිරිමෙන් අපි ලබන එකම ලාබය මේ සතුට තමයි"

රටේ නිහඬ බව බිඳෙන්නේ සිංහල දෙබස් හඬකින්.

''හිඟන්නෙකුට උනත් කියක් හරි දෙන්නෙ දුප්පත් මිනිහෙක්නෙ බං..'' කාන්තා කට හඬක් ඇසෙයි. ඈ බෝ ගහ හන්දියේ විමලාවති ය. අසුක්තියට අසාධාරණයට එරෙහිව පෙරමුණ ගන්නා බෝගහ හන්දියේ සරණෝ ගේ බිරින් දෑ ය.

මෙල්බන් නගරයේ උතුරු දෙසට වන්නට පිහිටි රෙසෙවෝ ප්‍රදේශයේ මහා ජල ටැංකියට මාඩිම්ව පිහිටි සුන්දර නිවහනට මම ගොඩවෙනවා. මෙතුලෝනියක් වට කරගත් හත් අට දෙනක් බෝ ගහ හන්දියට පණ පොවමින් ඉන්නවා. ඒ සියල්ල මෙහෙයවමින් කඩියකු සේ දුව පනින්නේ බෝ ගහ හන්දියේ සරණාපාල සී.

''කොහොමද බෝ ගහ හන්දියට ගොඩ වුණේ.?'' මම සරණාපාල ගෙන් ඇහුවා. ඔහු මේ ක්ෂෙත්‍රයේ ප්‍රවීණයෙක්. නමින් ශ්‍රීනාත් මද්දුමගේ.

''බෝ ගහ හන්දියට එන්න කලින් අපි 'අපේ කතා' කියලා ගුවන් විදුලි නාටයක් 3zzz ගුවන් විදුලියට කළා. ඒකත් අහම්බෙන් වුණා දෙයක්. ගුවන් විදුලි නාට්‍යයක් කරමු කියලා අපි කතා වෙච් හිටියා. දිගට කතාවක් කරන්න අපේ හිතේ තිබුණෙ නැහැ. ජගත් (ජගත් සේ එදිරිසිංහ) විනාඩි අටක පමණ කුඩා කතාවක් ලියලා මට දුන්නා. මේ කතාවේ විලියොං, මුදලාලි, ඔපිසර වගේ චරිත කිපයක් තිබුණා. මේක හාස්‍ය ජනක කතාවක්.

විලියොං මුදලාලිගෙන් ණයට රුපියල් සීයක් ඉල්ල ගන්නවා මාසෙකින් දෙන පොරොන්දුව මාසයක් ගියාම විලියොං ඔපිසරගෙන් ණයට රුපියල් සීයක් ඉල්ලනවා මාසෙකින් ආපහු දෙන පොරොන්දුව පිට. ඒ සීය ගෙනිහින් මුදලාලිට දෙනවා. ආයෙම මාසයක් ගියාම මුදලාලිගෙන් ආපහු රුපියල් සීයක් ඉල්ලාගෙන ඔපිසරට දෙනවා. හැම මාසෙකම ඒ පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තෙන් ඒ පැත්තටත් රුපියල් සීය ගානේ දෙනවා. දවසක් පාරෙදි විලියොන්ට ඔපිසර්ත් මුදලාලිත් දෙන්නාවම එක සැරේ හමු වෙනවා. දැන් අසන්නන් බලාපොරොත්තු වෙන්නෙ විලියොංගෙ ප්‍රෝඩාව අනුවෙලා කලබලයක් වෙයි කියලා.

ඒ වෙලාවෙදි විලියොං කියනවා ''ඔන්න දෙන්නවම එකට හමු වුණ එක හොඳයි. මං හැම මාසෙකම මුදලාලිගෙන් රුපියල් සීයක් ගත්තෙ ඔපිසර මහත්තයගෙන් රුපයල් දෙන්නයි. ඊළඟ මාසෙ ඔපිසර මහත්තයගෙන් රුපයල් සීයක් ගත්තෙ මුදලාලිට දෙන්නයි. මං ඉතින් කලේ ඔය රුපියල් සීය ඒ පැත්තටයි මේ පැත්තටයි මාසෙන් මාසෙට දුන්න එකනෙ. දැං ඉතින් මං ඔය ගනු දෙනුවට මැදිවෙන්න ඕනෙ නැහැනෙ. මුදලාලි එක මාසෙක ඔපිසර මහත්තයට රුපියල් සීයක් දෙන්න. ඔපිසර මහත්තයා ඊළඟ මාසෙ මුදලාලිට රුපියල් සීයක් දෙන්න.. ඔන්න මං ගියා..''

මේ කතාව රසවත් නිසා මේ චරිතම යොදාගෙන දිගටම කතා ලියමු කියලා අපි කතා වුණා. ඒ අනුව අපි 'අපේ කතා' කියන ගුවන් විදුලි නාට්‍යය කොටස් 51ක් පමණ දිගට අරගෙන ගියා. ජගතුත් ගාමිණී පැළඳ ත් මාත් චරින් වර පිටපත් ලිව්වා. දේවිකා සේනාධීර දසුන් ගපමන් ජගත් ජේ එදිරිසිංහ ගාමිණී පැළඳ චින්තක සිරිකුමාර සුගන්ධි ගපමන් මහිල් මුණිදාස සහ මම අපේ කතාවේ චරිත වලට පණ දුන්නා. අපේ කතා මෙල්බන් ගුවන් විදුලියේ අසන්නන් අතර ඉතාම ජනප්‍රිය වුණා. කතාව පටිගත කළේ

"හිඟන්නෙකුට උනත් කියක් හරි දෙන්නෙ දුප්පත් මිනිහෙක්නෙ බං.." කාන්තා කට හඬක් ඇසෙයි. ඈ බෝ ගහ හන්දියේ විමලාවති ය. අයුක්තියට අසාධාරණයට එරෙහිව පෙරමුණ ගන්නා බෝගහ හන්දියේ සරණෝ ගේ බිරින් දෑ ය.

දසුන්. සුගන්ධිත් පුදුම සහයක් දුන්නා. ඒ කාලය හරිම සුන්දරයි.

අපේ කතා තව දුරටත් ඉදිරියට ගෙන යන්න නොහැකි වුණා වෙලාවක තමයි මගේ හිතට මේ 'බෝ ගහ හන්දිය' වස්තු බීජය ආවේ. මට අවශ්‍ය පසුබිම විස්තර කළාට පස්සෙ ශ්‍රියානි ජයවික්‍රම පළමු කතාව ලිව්වා. එතැන් සිට අද දක්වාම බෝ ගහ හන්දිය ලියන්නෙ ඇයයි. අද වන විට අපි බෝගහ හන්දිය කොටස් 25 ක් කරලා තියෙනවා.

බෝ ගහ හන්දියට පසුබිම් වන පරිසරය ගැන යමක් කියන්න පුලුවන් ද සි මම ඇහුවෙ පිටපත ලියන ශ්‍රියානිගෙන්.

බෝ ගහ හන්දියට පසුබිම් වෙන්නෙ ලංකාවෙ නාගරික පැල්පත් වාසීන්ගෙ ප්‍රදේශයක්. මං ලංකාවෙ රාජකාරි කළ කාලයේ මේ වගේ පරිසර පිළිබඳ සෑහෙන්න අත්දැකීම් අරගෙ න තියෙනවා. මතු පිටින් මේ අය හරිම රළුයි කියලයි අපට හිතෙන්නෙ. වෙන එකක් තියා එයාලා කතා කරනා භාෂාව පවා අපට රලුවටයි ඇහෙන්නෙ. ඒත් බොහෝ විට වැදගත් යයි කියාගන්නනා අය ළඟ නැති මනුස්ස කම් මේ දුප්පත් රලු මිනිස්සු ළඟ තියෙනවා. වැදගත් යයි කියාගන්නා මිනිස්සුන්ට වඩා මේ දුප්පත් මිනිස්සුන්ගෙ ° හදවත් වෙනකෙනුගේ දුකේදි උනු වෙනවා. මෙන්න මේ මිනිස්සු ගැන කියන්න තමයි මං උත්සාහ කරන්නෙ.

මගේ හිතට කතා තේමාවක් ආවාම මං උදේ හවස දුම්රියේ වැඩට යන එන ගමන් පිටපත ලියනවා. ඒ පිටපත පටිගත කරන අවස්ථාවෙදි සමහර විට නලු නිලියන් අතින් හරි නිෂ්පාදක අතින් හරි මගේ අදහස තවත් හිටු වෙන දෙබස් එකතු වෙනවා. මොකද අපි කණ්ඩායමක් ලෙස එකතු වෙලා මේක කරන නිසා අනිත් අයගේ අදහසුත් මං සැලකිල්ලට ගන්නවා නිතරම.

ඔබේ නලුනිළියන් ගැන ඔබ තෘප්තිමත් ද? ඒ පැනය බෝ ගහ හන්දිය නිෂ්පාදනය කරන ශ්‍රීනාත්ටයි

ඒ අතින් මං හරිම වාසනාවන්තයි. මෙතරම් දක්ෂ ලෙස හඬ කවන ශිල්පීන් පිරිසක් ලැබීම භාග්‍යයක්.

විමලාගේ චරිතයට පණ දෙන දේවිකා සේනාධීර

සුදා ලෙස රඟපාන ගාමිණී පැළඳ

චූටියා ලෙස රඟපාන චින්තක සිරිකුමාර

ලකී ලෙස රඟපාන මහිල් මුණිදාස

සහ විවිධ චරිත සඳහා වරින් වර සම්බන්ධ වෙන ගයනි ගිසන්තිකා මාලන් සුරවීර ශ්‍රියානි සහ ජගත් මට ලබා දෙන සහය විශිෂ්ටයි. මේ අයගේ දක්ෂතා ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි නාට්‍ය සඳහා හඬ දෙන නලු නිළියන්ට දෙවෙනි නැහැ. ඒ තරමට ඔවුන් දක්ෂයි.

බෝ ගහ හන්දියේ විමලා ට - දේවිකා සේනාධීර ට - දැන් සවන් දෙමු.

මුලින්ම අපේ කතා ගුවන් විදුලි නාට්‍යයට මට ආරාධනා කළේ ශ්‍රීනාත් සහ ජගත්. ඔවුන් මගේ කටහඬේ මොකක් හරි විශේෂත්වයක් නිරීක්ෂණය කර තියෙන්න ඇති. මුලදී මාත් ඒකට සම්බන්ධ වුණේ චකිතයකින්. ඒත් ශ්‍රීනාත් ගෙ උපදෙස් යටතේ චරිතය ගොඩ නගන කොට තිනේ යටතේ චරිතය ගොඩ නගන කොට තිනේ විශ්වාසයක් ඇති වුණා. මේක මට හරිම අපූරු අත්දැකීමක්.

බෝ ගහ හන්දියේ විමලා කියන්නෙ කොළඹ නාගරික මුඩුක්කු පරිසරයක කාන්තාවක්. ඇගේ කටහඬෙන් වචන උච්ඡාරණය කරන විදිහෙන් ඒ පරිසරයේ කාන්තාවක් මවන්න මං උත්සාහ ගන්නවා.

බෝගහ හන්දියේ සුදා ගේ චරිතය රඟන ගාමිණී පැළඳ මේ ගුවන් විදුලි නාට්‍ය කණ්ඩායමට සම්බන්ධ වෙන්නෙ අපූරු ආකාරයකට.

34 වන පිටුවට